www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: සසප සමාජවාදී ජාත්‍යන්තරවාදය උදෙසා ගෙන ගිය 40 වසරක අරගලය සමරයි

## Sri Lanka: SEP marks 40 years of struggle for socialist internationalism

**2008 ජුලි 11**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානය, සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) පිහිටුවීමේ 40 වන සංවත්සරය සමරනු වස් ජුලි 16 දා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

1968 දී විකොස පිහිටුවන ලද්දේ, ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964 දී ට්‍රොට්ස්කිවාදී ප්‍රතිපත්ති පාවා දී සිරිමාවෝ බන්ඩාරනායක මැතිනියගේ ධනපති ආන්ඩුවට එක්වීමෙන් පසුව ය. ලසසපයේ දේශපාලන ද්‍රෝහිත්වය ශ්‍රී ලංකාවේ පමනක් නොව ආසියාව පුරා සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය සඳහා ප්‍රගාඪ ප්‍රතිවිපාක ගෙන ආවේ ය.

විකොස පිහිටුවූ අය, බන්ඩාරනායක ආන්ඩුවට එක්වීමේ ලසසප තීන්දුව ප්‍රතික්ෂේප කලා පමනක් නොව, දෙවන ලෝක යුද්ධයෙන් පසුව හතර වන ජාත්‍යන්තරය ඇතුලත මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩෙල් විසින් නායකත්වය දෙන ලද අවස්ථාවාදී ප්‍රවනතාවයේ පැනනැගීම තුල එම පාවාදීමේ දේශපාලන මූලයන් සොයා ගත්හ. පැබ්ලෝවාදී අවස්ථාවාදයට එරෙහිව සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ක්‍රියාමාර්ගය ආරක්ෂා කරනු පිනිස 1953 දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පිහිටුවන ලදි. විකොස පිහිටුවන ලද්දේ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව ලෙස ය.

සිය ආරම්භයේ පටන් ම ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ ප්‍රතිපත්ති මත දැඩිව පාදක වූ විකොස, සියලුම රූපාකාරයන්ගේ මධ්‍යම පන්තික රැඩිකල්වාදයන්ට ද මාඕ සේතුං, හෝ චි මිං හා චේ ගුවේරා වැනි පුද්ගලයන් වැලඳගැනීමේ එකල පැවති උන්මාදයට ද විරුද්ධව කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා ක්ෂමා විරහිත අරගලයක් ගෙන ගියේ ය. ලසසපයේ පාවාදීමෙන් නිර්මානය කෙරුනු දේශපාලන ව්‍යාකූලත්වය, සිංහල හා දෙමල තරුනයන්ගේ රැඩිකලීකරනය වූ ස්ථර වාර්ගික ස්වෝත්තමවාදයේ හා යුද්ධයේ ප්‍රතිගාමී මාවත් ඔස්සේ මෙහෙය වූ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පැනනැගීමට තුඩු දුන්නේ ය.

සසප සහ එහි පූර්වගාමී විකොස පමනක් ම, ජාතිකවාදයට හා බෙදුම්වාදයට විරුද්ධ වීමෙන් ද වර්ගය, හමේ පැහැය, ජාතිකත්වය හෝ ජනවාර්ගිකත්වය නොතකා සියලු ම කම්කරුවන්ගේ එකමුතුව වෙනුවෙන් සටන් කිරීමෙන් ද දකුනු ආසියාව පුරා හා ලොව වටා සමාජවාදය උදෙසා වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධය අවසන් කිරීමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කිරීමෙන් ද කාලයේ පරීක්ෂාවට සාර්ථකව මුහුන දී තිබේ. පසුගිය 40 වසරක විකොස/සසප අරගලවල පොහොසත් පාඩම් සෑම තන්හිම, විශේෂයෙන් ම ආසියාවේ, ලතින් ඇමරිකාවේ හා අප්‍රිකාවේ, කම්කරුවන් හා තරුනයන් සඳහා සෘජුව ම අදාල ය. අපගේ රැස්වීමට සහභාගි වන ලෙස තරුන ජනයාට, කම්කරුවන්ට හා බුද්ධිමතුන්ට අපි උනුසුම්ව ආරාධනා කල සිටිමු.

ප්‍රධාන කතිකයා වනු ඇත්තේ විකොස ආරම්භක සාමාජිකයකු වන සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් ය.

**ස්ථානය: කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**

**වේලාව: ජුලි 16 දා සවස 4.00**

© www.wsws.org